ශ්‍රී ලංකාවේ දේශපාලන අනාගතය කොයිබටද? කොටස 2



ලංකාවේ පක්ෂ දේශපාලනය මේ මොහොතේ ඉතිහාසයේ කවරදාකවත් නැති අභියෝග වලට මුහුණ දෙමින් සිටිති.ඒවායේ භූමියේ ආරම්භය සනිටුහන් වන්නේ සැබවින්ම පොහොට්ටුව හෙවත් පොදු ජන පෙරමුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පොදු ජන එක්සත් පෙරමුණ තුලින් අලුත් පක්ෂයක් ලෙස නැගී සිටීමෙනි.ඒ සමගම එක්සත් ජාතික පක්ෂය දෙකඩ වීමෙන් පසු සජබය බිහිවීමෙනි.ඊට ඉහතදී ජවිපය දෙකඩ වීමෙන් පෙරටුගාමී සමාජවාදී පක්ෂය බිහි වුණද එහි දේශපාලන බලපෑම සුළු වීම නිසා එයට විශාල අවධානයක් හිමි නොවීය.නවතම තත්ත්වය අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද දෙකඩ වී තිබේ.ඒ මෛත්‍රීගේ .එස් ඩබ්ලිව් ගේ නිදහස් පක්ෂය හා වෙල්ගමගේ සී බී කේ නව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වශයෙනි.

මේ සියළු වෙනස්කම් තුළ ලංකාවේ පක්ෂ දේශපාලනය තවත් විශාල පසුබෑමක් වූයේ පොදුජන පෙරමුණට 2020 වසරේ ලැබුණු අධිකතර බලයයි.මේ අධිකතර බලය තුළ ගොඩ නැගුණු අධික බලතල හා විධායක බලතල ගොනු වීමේ ප්‍රථිපලය වුයේ සැබවින්ම ජනතාව මාර්ගයට පැමිණීමයි.එය අරගලයක් දක්වා වර්ධනය වීමයි.අරගලය නිර්පාක්ෂික අරගලයක් යයි මිනිසුන් හඳුන්වන්නට පටන් ගන්නේ ලංකාවේ පක්ෂ දේශපාලනය දුර්වල වීම හා ඒ පක්ෂ පවතින දේශපාලනයේ බල රහිත වීම අවලංගු වීමක් ලෙස ජනතාව පිළිගෙන ඇති බැවිනි.ජනතාවට එම පක්ෂ එසේ පිලිනොගන්නට හේතු වූ පළමු කාරණාව 2/3 බලය පමණක් නොවේ.

අර්බුධයන් මවන භූ දේශපාලනය තුළ පක්ෂ අප්‍රසාදයට පත්වීම

ලංකාව සේද මාවත නිසා භූ දේශපාලනයේ අසියා-පැසිෆික් කලාපයේ විවාදගත දුපතක්ය.එක අතකින් සහශ්‍රකයේ වැඩෙමින් පවතින ආසියාවත්,එහි බලවතුන් වන ඉන්දියාව හා චීනයත් ලංකාවට ඍජුව මැදිහත් වෙමින් සිටී.අනෙක් අතින් ආසියා පැසිෆික් කලාපයේ ඔස්ට්‍රේලියාව හා බටහිරයේ බලය ගිලිහෙමින් ඇති ඇමෙරිකාවත් මේ දූපත ගැන අවධියෙන් සිටී.මේ අවධානය බලය මාරු කිරීම හා බලය සෙලවීම මෙන්ම බලය පාලනය කිරීම යන කාරණා වලදී භූ දේශපාලනයේ බලපෑම දේශපාලන පක්ෂ දෙසට තදින්ම සිදුවේ.පක්ෂ නායකයන් රහසින්,හා ප්‍රසිද්ධියේ තානාපති වරුන් හමුවෙති.උපක්‍රමශිලිව අනෙකුත් භූ දේශපාලන

පාර්ශවයන් ඇවිස්සීම උදෙසා සමාජ මාධ්‍යවල ජයාරූප පල කරති..මෙයින් ලාංකීය ජනසමාජය තම මාතෘ භූමිය තුළ තම පක්ෂ ක්‍රියාකාරී වන ආකාරය වටහා ගනී.මේ සමගම අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ යන චෝදනාව හා ඒ හරහා ගොඩ නගන ජාතිකත්වය හෝ ජාතිවාදය යන සංකල්ප සහිත පක්ෂ වලට දේශපාලන භූමියේ අද ඉතිරිව ඇත්තේ විසුළුකාරී බවක් පමණි. ඒ ඔවුන් භූ දේශපාලන උවමනාවන් ඉටුකරන බව ජනතාවට වැටහී ඇති බැවිනි.

මේ තත්ත්වයම මෛත්‍රිපාල සිරිසේන ජනාධිපති ගේ ක්‍රියා කලාපය නිසා ලංකාවේ දේශපාලන පක්ෂ වලට මුහුණ දෙන්නට සිදුවිය.සැබවින්ම අරගලය ට පෙර සිදු වූ පාස්කු ප්‍රහාරය සියුම්ව විග්‍රහ කරන විට ශ්‍රී ලංකාවේ පක්ෂ භූ දේශපාලනයෙන් හානියට ලක්වූ ආකාරය වටහා ගත හැකිය.මහින්දට හෝ ගෝඨාබයට වඩා සංවේදී බවක් හා යම්තාක් සරල නායකයකු වූ සිරිසේන භූ දේශපාලනයේ උගුලට අසුවෙමින් ලාංකීය දේශපාලනය උඩු යටිකුරු කරන ලද අවස්ථාව සියුම්ව අධ්‍යනය කල යුතුය.2019 අප්‍රේල් 21  දා සැලසුම් සහගත ලෙස බෝම්බ මාලාව පිපිරිණි.විනාඩි දහයක් යන්නටත් පෙර ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ජනපති ට්‍රම්ප් ට්විටර් සටහනක් තබමින් ලංකාවේ මියගිය මිලියන 380 ක් ජනගහනය ගැන ශෝකය පල කළේය.ලංකාවේ ජනතාවට ඩොලර් මිලියන 480 ක ප්‍රදානයක් ද ලබා දෙන බව එහි සටහන් විණි.බැලු බැල්මට කෙනෙකුට ට්‍රම්ප් ගේ හදිසිය ඔවුන් මේ බෝම්බ මාලාවට සම්බන්ධයක් ඇතැයි සැක පහල කරයි.ට්‍රම්ප් මියගිය 380 දෙනා මිලියන වශයෙන් හඳුන්වා දී තිබුණි.විනාඩි කිහිපයකින් එය නිවැරදි කරනු ලැබුවත් ඒ කරුණින් වැටහෙන්නේ භූ දේශපාලනයේ තරඟය ය. චීනය යමක් කිරීමට පෙර ඇමෙරිකාව ලකුණු දමා ගැනීමය.පසුකාලීනව සිදුවන ලංකාවේ දේශපාලන කථා බහවලදී ,චීනය කෙතරම් තමාට උදව් කරනු ලබන්නේද යන්න සිරිසේන විස්තර කරනු ලැබුණි.එය  සත්‍ය පම්පෝරියකි.චීනය පාස්කු ප්‍රහාරයෙන් වැඩිම වාසි ලබන්නා විය.ඒ කෙසේද යත්  පාස්කු ප්‍රහාරය යනු ලංකාවේ සියළුම දේශපාලන පක්ෂ සූක්ෂමව සම්බන්ධ කරගත් භූ දේශපාලනකිව රාජපක්ෂලා බලයේ ස්ථාපිත කිරීම උදෙසාම වූ ක්‍රියාවක් බව ඔප්පු වෙමින් පවතී.පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියළුම දෙනා සියළුම දේශපාලන පක්ෂවලට සම්බන්ධකම් තිබුණු පුද්ගලයන්ය.කොළඹදී පිපිරෙන හත්වන බෝම්බය පිපිරෙන්නේ දෙහිවලදීය.ඒ සහරාන්  ගේ බාප්පා වන ඉබ්‍රහිම්ට සම්බන්ධ නිවසකය.ඉබ්‍රහිම් ජාතික ජන බලවේගයේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූර අපේක්ෂකයෙකි.බෝම්බය පිපිරී නැති බව දැනගත් බුද්ධි අංශ බෝම්බ කරුට පෙර එම නිවසට ගොස් තිබීම හාස්‍යයකි.එනම් බුද්ධි අංශ ඒ වන විට ශ්‍රී ලංකා ජනරජයේ පාලනය මගින් මෙහෙයවමින් මේ අපරාධය ගැන දැනීම ඇතිව සිටිබව නීතිමය ඒත්තු ගැන්වීමකි.එහෙත් පාස්කු ප්‍රහාරයේ වගකීම ලංකාවේ සියළුම පක්ෂ වලට බෙදා හදා දෙමින් භූ දේශපාලනය ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය හා ඒවාට ඇති විශ්වාශය නැත්තටම නැති කරන්නට පියවර තබන්නේ එලෙසය.ඒ අනුව ඉදිරි පාස්කු නඩු විභාගය චන්ද්‍රිකාගේ පියා විසින් බිහිකළ පංච මහා බලවේගයේ හා ජාතිකත්වයේ පක්ෂය නැත්තටම නැති කර දමන්නේ එහි සිරිසේන නායකයා නිසාය.

ඔබට ශ්‍රී ලාංකීය දේශපාලන පක්ෂ පත්ව ඇති විශ්වාශය කඩවීම,බංකොලොත් වීම යන කරුණු වටහා ගන්නට හූ දේශපාලනිකව ගොඩ නගන ලද අනෙක් දේශපාලන සංසිද්ධිය වන අරගලය ගැනද යමක් සටහන් කළ යුතුව ඇත.ගෝඨාබයගේ චීන ගැති අක්‍රිය,දුර්වල පාලනය තුළ පොර්ට් සිටිය චීනයට ලියා දීම නිසා ශ්‍රී ලංකාව ඉතිහාසයේ විශාලතම වරද සිදුකරගනී.ඒ අසියා පැසිෆික් කලාපය තුළ ඉන්දීය කලාපයේ භූමියක්,හෙවත් ස්වෛරී භූමියක් චීනයට හිමිකර දීමය.ඒ හරහා නැගෙනහිර ජැටියට චීන හිතවාදී පක්ෂ ගෙන ආ විරෝධයය.එම හූ දේශපාලන ගැටළුව ගෝල්ෆේස් භූමිය පොර්ට් සිටියට ආසන්නයේ අරගල බිමක් බවට පත්කරන ලදී.එහි ව්‍යපාරික කටයුතු සිදු නොවීමට එයින් බලපෑමක් විය.ගෝඨාබය මේ හූ දේශපාලනය වටහාගත්තේ නැත.ඔහුට ඔහුගේ ආරක්ෂාව වත් සලසා ගන්නට නොහැකි විය.කෙසේ නමුත් චීන හිතවාදී පක්ෂ අරගලයට පළමුව විරුද්ධ විය.දෙවනුව ඔවුන් අරගලය තුලට රිංගා චීන මුදල් මත අරගලයේ දේශපාලන වාසිය තම පක්ෂ වලට හරවා ගැනීමට සුදානම්ය.ඒ අතර වාරයේ අගමැතිකම දෝලනය විය.ගෝඨාබය ඉල්ලා අස් වූ පසු ජනාධිපතිකම දෝලනය විය.පක්ෂ දේශපාලනයේ වගකීම් පැහැර හැරීම ජනතාව ඉදිරියේ පෙනෙන්නට විය.අරගලය තුළදීත් පොදුජන පෙරමුණ පාරට බහින්නට නොහැකි වන සේ ජනතා අප්‍රසාදයට පත්වන විට පක්ෂ දේශපාලනය වගකීම් පැහැර හැරීම නිසා අප්‍රසාදයට පත් වී ඇත.මේ අනුව ලංකාවේ පවතින දේශපාලන පක්ෂ වල අනාගතය ඉතා ඛේදනීය මට්ටමක පවතී.දැන් මැතිවරණයකට ගියහොත් කුඩා කොටස් වලට බිඳී ගිය ජනමතයක් පිළිඹිබු වෙයි.එය එසේ වන්නේ නම් රටේ අනාගත දේශපාලනය හා ආණ්ඩු අස්ථාවර ය.එය දිගින් දිගටම සිදුවීම අපේ රටට බහුවිධ නරක ප්‍රථිපල ගෙනදේ.

පක්ෂ දේශපාලනයේ නායකත්වය ගැන ඊලඟ ලිපියෙන් ..

ගැමුණු ශ්‍රාවස්තිබණ්ඩාර